Australian Government

Fair Work OMBUDSMAN

භාෂා සහාය

2009 ජූලි 1 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි ඕස්ට්‍රේලියානු රාජකාරී ස්ථාන සම්බන්ධතා පිළිබඳ නීතියේ වෙනස්කම් සිදුවේ.

මෙම නීති මගින් සේවයේ යෙදී සිටින අයගේ අයිතිවාසිකම් සහ වගකීම් පැහැදිලි කරදේ.

මෙම වෙනස්කම් ඕස්ට්‍රේලියාවේ රාජාකාරී ස්ථාන බොෙ භාමයකට අදාලවේ.

මෙම අයිතිවාසිකම් සහ වගකීම්වලින් සමහරක් නම්:

- සේවකයන් විසින් ලැබිය යුතු වේතන
- නිවාඩු හිමිකම් සහ සේවා කොන්දේසි
- සේවායෝජකයන් විසින් තැබිය යුතු වාර්තා
- සේවය කරන විටදී ගැටළුවක් ඇතිවුවහොත් ෙ ස්වකයන් සහ සේවායෝජකයන් හට උපකාර ලබා ගත හැති ආකාරය
- ජාතිය, ගැහැණු පිරිම බව, ලිංගිකත්වය, වයස, කායික හෝ මානසික ආබාධ හෝ විවාහක තත්වය මත ෙ වනසකට ලක් නොකිරීම.

උදව් ලබා දිය හැක්කේ කා විසින්ද?

නව රාජකාරී ස්ථාන සබඳතා ක්‍රමය යටතේ සංවිධාන 2 ක් ඇත.

එවානම් Fair Work Commission සහ Fair Work Ombudsman ය.

Fair Work Commission යනු ජාතික රාජකාරී ස්ථාන සබඳතා විනිශ්චය සභාවයි. මෙය පහත සඳහන් විවිධ ආකාරයේ කරුණු සම්බන්ධයෙන් කටයුතු කිරීමට බලතල ඇති ස්වාධීන ආයතනයකි:

- අවම වැටුප් සම්බන්ධ ආරක්ෂක දැල සහ සේවා කොන්දේසි
- සාමූහික කේවල් කිරීම
- වෘත්තීය සමිති ක්‍රියාමාර්ග
- ආරවුල් විසඳීම
- සේවය අවසන් කිරීම
- වෙනත් රාජකාරී ස්ථාන කටයුතු.

Fair Work Ombudsman මගින්:

- ඕස්ට්‍රේලියානු රාජකාරී ස්ථාන නීති සම්බන්ධයෙන් උපදෙස් සහ දැනුම ලබාදේ
- ජාතික රාජකාරී ස්ථාන නීති අනුව කටයුතු කිරීම අධීක්ෂණය සහ ඒ සම්බන්ධ කඩකිරීම් විමර්ෂණය කිරීම සිදු කරයි
- රාජකාරී ස්ථාන සම්බන්ධ අයිතිවාසිකම් සහ වගකීම පිළිබඳ තොරතුරු ප්‍රකාශයට පත් කිරීම සිදු කරයි
- කුඩා ව්‍යාපාර සඳහා මෙවලම් සහ තොරතුරු සපයාදේ.

වැඩි විස්තර අවශ්‍යයද?

- තොරතුරු අංක 13 13 94 ඔස්සේ Fair Work හා සම්බන්ධවන්න.
- පරිවර්තන සඳහා, දිනකට පැය 24 පුරාත් සතියකට දින 7 ක පුරාත් ප්‍රාදේශීය දුරකථන ගාස්තුවට අංක **131 450** ඔස්සේ පරිවර්තන සහ තෝල්ක සේවාව **(Translating and Interpreting Service (TIS))** අමතන්න.

ඔබට විශ්වාෂය කැබිය හැකි උපදෙස් සැපයීමට Fair Work Ombudsman කැප වී සිටී.
මෙම තොරතුරු පත්‍රිකාවෙහි ඇතුළත් තොරතුරු ස්වභාවයෙන් සාමාන්‍යය. ඔබේ ගැටලුව සම්බන්ධයෙන් මෙම තොරතුරු අදාළ වන්නේ කෙෂේදැයි ඔබට සැකයක් ඇත්නම් 13 13 94 අංකයෙන් අපේ තොරතුරු සේවයට ඇමතිය හැකිය. නොඑසේනම්, කම්කරු සංගමය, කර්මාන්ත සමාගම හෝ සේවාස්ථාන සම්බන්ධීකරණ නිලධාරියකු හා කතා කරන්න.

Last updated: December 2013
© Copyright Fair Work Ombudsman
FWOFSSI1.02